සිද්ධි අධ්‍යයනය 2022 -

# බුලත් වගාව ආර්ථික වැවිලි භෝගයක් ලෙස



සැකසුම : කේ.බී.එම්.සී.එන් විජේවර්ධන

මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

# පටුන


1. ඓතිහාසික පසුබිම

2. බුලත් හා බැඳුණු සිරිත් විරිත් හා පිලිගන්වන ක්‍රම

3. ශ්‍රී ලංකාවේ බුලත්වල ස්වභාවය හා එහි ප්‍රභේද

4. අධ්‍යයනයේ මූලික අරමුණු

5. අධ්‍යයනයේ වැදගත්කම

6. බුලත් වගාව සිදු කරන ආකාරය

   6.1 බිම් සකස් කිරීම, පැළ සිටුවීම හා පොහොර යෙදීම

   6.2 රෝග හා පලිබෝධ හානි

   6.3 වෙළඳපලට සැපයීම සඳහා බුලත් සැකසීම

7. සම්පත්දායකයින් විසින් ලබා දුන් දායකත්වය

8. හඳුනාගත් ගැටළු හා ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා

9. දෙපාර්තමේන්තු අපේක්ෂාව

## බුලත් වගාව ආර්ථික වැවිලි භෝගයක් ලෙස

### 1. ඓතිහාසික පසුබිම

සදාහරිත බහුවාර්ෂික වැල් ශාකයක් වන බුලත්වල මූලාරම්භය මැලේසියාව හෝ නැගෙනහිර ආසියානු කලාපයේ යැයි විශ්වාසයක් පවතී. චීන, අරාබි හා මුස්ලිම් වෙළෙන්දන් විසින් ශ්‍රී ලංකාව හා අනෙකුත් දකුණු ආසියාතික රටවලට බුලත් හඳුන්වා දී ඇති බව සඳහන් වේ . ශ්‍රී ලාංකික ජනතාව බුලත් භාවිතා කල බවට සාක්ෂි ක්‍රි.පූ.340 දක්වා ඈතට දිවෙයි.

හින්දූන්ට අනුව බුලත් දිව්‍ය ලෝකයෙන් ලැබුණු බවත්, බෞද්ධයන්ට අනුව නාග ලොවේ සිට ලැබුණු බවත් විශ්වාසයක් පවතී. නාගයන් විසින් මනුලොවට බුලත් ගෙන එනු ලැබුවේ මුඛයෙන් අල්ලා ගෙන බවත්, බුලත් සැපීමේදී බුලත් කොළයේ අග කොටස කඩා දමනුයේ එම නාග විෂ දුරු කරලීම සඳහා බවත් කියවේ. අතීතයේ කැළණි පුරවරයේ සිටි ජනතාව මෙම ජනප්‍රවාදයට අනුව යමින් බුලත් කොටුවකින් ලබා ගන්නා මුල්ම බුලත් කොළ පුවක් මලක් සමඟ කැළණි විහාරයට පූජා කළ බව සඳහන් වේ.

බුලත් හුරුල්ලකට හෙවත් බුලත් අතකට බුලත් කොළ 40ක් යොදා ගනී. මේ සම්බන්ධයෙන්ද විවිධ මතයන් පවතී. මැණික් පුටුවක් සම්බන්ධයෙන් ඇතිවූ චූලෝදර මහෝදර ගැටුමේදී එම

ගැටුම සමථයකට පත්කිරීම සඳහා බුලත් කොළ 20 බැගින් දෙපාර්ශවයම නියෝජනය වන පරිදි යොදා ගෙන ඇත. එක් පාර්ශවයකින් බුලත් 20 ක් යොදා ගෙන ඇත්තේ චූලෝදර හා මහෝදර ප්‍රධානීන් දෙදෙනොගේ අතේ හා පාදවල ඇඟිලි 20 පදනම් කරගෙනය. මෙම බුලත් එක මත එක තැබීමෙන් සංකේතවත් වන්නේ සාමය, සමඟිය හා සහජීවනයයි. අතීතයේ පටන්ම බුලත් පූජනීයත්වයෙන් සලකා ඇති බවත්, සිංහල සංස්කෘතියේ ප්‍රමුඛස්ථානයක් එයට හිමිව තිබූ බවත් මින් ප්‍රකට වේ. ආචාර සමාචාර කිරීමටත් , සමාව ගැනීමට හා පිලිගැනීමට හා ජාතික උත්සව අවස්ථාවලදී ආදී බොහෝ කාර්යයන් සඳහා බුලත් අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ.

බුලත් සැපීම පිළිබඳව සලකා බැලීමේදී නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපියෙන් ද , මහාවංශයේ ද කරුණු සඳහන් වේ. එම සාක්ෂීන්ට අනුව රජවරුන් හා උසස් කුලවතුන් අතර බුලත් ජනප්‍රියව තිබූ බව කියැවේ. රොබට් නොක්ස්ගේ “එදා හෙළදිව” කෘතියේ සඳහන් වන්නේ “සිංහලයන් කැවුම් කෑමටත් වඩා ආශා කරන්නේ බුලත් සැපීමට” බවය. ඒ අනුව පැහැදිලි වන්නේ අතීතයේ සිටම බුලත් හා බුලත් සැපීම ජනප්‍රිය මෙන්ම, සිංහල සංස්කෘතියේ ප්‍රමුඛස්ථානය ගත් එකක් බවය.

ඈත අතීතයේ පටන්ම ග්‍රාමීයව මෙන්ම නාගරිකවද නිවෙස්වල පුද්ගලික අවශ්‍යතාවය සඳහා බුලත් වැලක්

හෝ පන්දලමක් සිටුවා තිබීම දැකිය හැකිය. දේශිය පරිභෝජනය සඳහා වගා කළද පසුකාලීනව විදේශීය වෙළඳපල විවෘත වීමත් සමඟම බුලත් සඳහා දේශිය මෙන්ම විදේශීය වෙළඳපල වටිනාකමක්ද ලැබිණි.

## 2. බුලත් හා බැඳුණු සිරිත් විරිත් හා පිලිගන්වන ක්‍රම

සිංහල සිරිත විරිත් පිළිබඳව සැලකීමේදී බුලත් යනු අත්‍යවශ්‍යම අංගයක් මෙන්ම ප්‍රධාන ස්ථානයක් ගන්නා දෙයකි. වැඩිහිටියන්ට ගෞරවාචාර දැක්වීම, ගුරු දෙගුරුන් නැමදීම, සමා කර ගැනීම, ආශිර්වාද ලබා ගැනීම, ආයුර්වේදීය කටයුතු සඳහා හා ජාතික උත්සව සඳහා බුලත් අත්‍යවශ්‍යම සාධකයකි.

තවත් පුද්ගලයෙකුට බුලත් පිලිගැන්වීමේදී පිලිගන්වන රටාවන් කිහිපයක් අතීතයේදි දැක ගත හැකිය.

- බුලත් කොළයේ නටුව කොටස පිලිගනු ලබන තැනැත්තා දෙසට හරවා පිලිගැන්වීම.

  මෙම ක්‍රමය භාවිතා කරන්නේ උගතුන්, වියතුන් හෝ ගෞරවනීය පුද්ගලයන්ට බුලත් පිලිගැන්වීමේදී ය.

උදා:- ගුරුවරයෙක් / වැඩිහිටි ඥාතියෙක් / ස්වාමීන් වහන්සේ හෝ වෙනත් ප්‍රභූවරයෙකුට පිලිගැන්වීමේදී

- බුලත් කොළය හරහට තබා පිලි ගැන්වීම.

  මෙම ක්‍රමය භාවිතා කරන්නේ වයසින් සමාන හෝ වෙනත් කරුණකින් සමකාලීන අය සඳහා බුලත් පිරිනැමීමේදීය.

- බුලත් කොළයේ නටුව තමා දෙසට හරවා පිලිපිලිගැන්වීම.

  තමන්ට වඩා අඩු කුලයකින් යුක්ත තැනැත්තකුට බුලත් පිලිගැන්වීමේදී මෙම ක්‍රමය අනුගමනය කර ඇත.

බුලත් දීමේ රටාව පිළිබඳව ජන කවියකින් මෙලෙස ප්‍රකාශ වී තිබේ .

බුලත් දීම දෙන් පෙර සිරිත අනුවම
මහත්මනට දෙන් නැටි කොණ හරවාම
සමත් අයට බුලතේ හරහටම
පහත් අයට දෙන් වලිගය හරවාම

**3. ශ්‍රී ලංකාවේ බුලත්වල ස්වභාවය හා එහි ප්‍රභේද**

උද්භිද විද්‍යාත්මකව පයිපරේසියේ (Piperaceae) කුලයට අයත්වන බුලත් විද්‍යාත්මකව “පයිපර් බෙට්ලේ” ( Piper Betel.L. ) යන නාමයෙන් හඳුන්වයි . තිප්පිලි, ගම්මිරිස්, රට කරල් හා වල් ගම්මිරිස් මෙම කුලයට අයත් අනෙකුත් ශාකයන් වේ.

බුලත් කොළයේ 80% පමණ ඇත්තේ ජලයයි. වාෂ්පශීලී රසායන ද්‍රව්‍ය නිසා මෙහි සැර ගතිය ඇතිවේ.බුලත් වගාව සඳහා දීප්තිමත් හිරු එළිය අත්‍යවශ්‍ය වන අතර , වියළි කලාපයට වඩා අන්තර් මධ්‍ය කලාපය හා තෙත් කලාපය වඩාත් හිතකර වේ. මුහුදු මට්ටමේ සිට උස මීටර් 1000 දක්වා ප්‍රදේශවල සාර්ථකව බුලත් වගා කළ හැකිය. වර්ෂය පුරාම පැතිරුණු වර්ෂාපතනයක් හා

හොඳින් හිරු එළිය පැවතීම සාර්ථක බුලත් වගාවකට හේතු වේ. විශේෂයෙන්ම බොරළු සහිත ලැටරයිට් පස මෙම වගාව සඳහා ඉතාමත් යෝග්‍ය වේ.

ශ්‍රී ලංකාවේ වගා කරන බුලත් ප්‍රභේද රාශියක් හඳුනා ගත හැකිය.

I. මානේරු
II. රටදළු
III. ගල්දළු
IV. ගැටතෝඩු
V. ගැරඩි මානේරු
VI. නාගවල්ලි
VII. මැටිපලා
VIII. කළු බුලත්
IX. වැල් බුලත්
X. මල බුලත්

ඒ අතරින් රටදළු, මානේරු හා ගල් දළු අපනයනය සඳහා වගා කිරීමට සුදුසු බුලත් ප්‍රභේදයන් වේ.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අපනයනය සඳහා නාරම්-මලී හා නාරම් - රතී ලෙස ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් බුලත් වර්ග 2 ක් හඳුන්වා දී ඇත. මෙම ප්‍රභේද දෙකින්ම ඉනි 1000 ක පාත්තියකින් වසරකට බුලත් කොළ 50,000 ක් පමණ ලබා ගත හැකිය. සාමාන්‍යයෙන් නාරම්මලී බුලත් කොළයක් 18.98cm ට වඩා

වැඩි දිගින් යුක්ත හා පළල 14.56 cm ට වඩා වැඩි වේ. නාරම්රතී බුලත් කොළය 17.85 cm ට වඩා වැඩි දිගක් වන අතර 14.75 cm පමණ පළලින් යුක්තය.

තද කොළ පැහැයෙන් යුක්ත, කඩතොළු වලින් තොර, සැර ගතියක් සහිත, වියලී නොගිය, විශාල බුලත් කොළ අපනයන තත්වයේ බුලත්වලට තිබිය යුතු ගුණාංග වේ. බුලත් අපනයනයේදී අපගේ ප්‍රධාන ගැනුම්කරුවා වන්නේ පකිස්ථානයයි. ප්‍රංශය, ජර්මනිය, ජපානය, මාලදිවයින, මලයාසියාව හා ස්විට්සර්ලන්තය වැනි රටවලට ද සැලකිය යුතු ප්‍රමාණයකින් බුලත් අපනයනය කෙරේ.

## 4. අධ්‍යයනයේ මූලික අරමුණු

- ව්‍යවසායකයෙක් ලෙස බුලත් වගාවේ යෝග්‍යතාවය හැදෑරීම.
- රැකියා මාර්ගයක් මෙන්ම අමතර ආදායම් මාර්ගයක් උත්පාදනය කර ගැනීමට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් ( සුදුසුකම්) හඳුනා ගැනීම.
- වෙළඳපොල සම්බන්ධීකරණයන් ගොඩ නඟා ගැනීමට අවශ්‍ය පසුබිම හඳුනා ගැනීම.

## 5. අධ්‍යයනයේ වැදගත්කම

- බුලත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම හා ඒ සඳහා අභිප්‍රේරණයක් ඇති කිරීම.
- දේශීය ආර්ථිකය ගොඩනැංවීමට දායක වීම.
- පවත්නා විරැකියා තත්වය අවම කර ගැනීමට අවශ්‍ය රැකියාවන් උත්පාදනය කිරීම.

## 6. බුලත් වගාව සිදු කරන ආකාරය

### 6.1 බිම් සකස් කිරීම, පැළ සිටුවීම හා පොහොර යෙදීම

වගා කිරීමට සුදුසු ක්ෂේත්‍රයක් තෝරා ගැනීමේදී හැකි තරම් දුරට සමතලා බිමක් යොදා ගත යුතුය. සමතලා බිමක් නොවූ විට පැල වලට යොදන පොහොර හා ජලය එක් තැනට එක්

රැස් විය හැකි අතර , එය බුලත් දඬු හා වැල් මැරී යාමට හේතු වේ. එමෙන්ම සාරවත්ව බුලත් වැල් වැඩීම සඳහා හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක් විය යුතුය. නමුත් අපනයන තත්වයේ කළු බුලත් නිෂ්පාදනයේදී 45% ක් පමණ සෙවණක් අවශ්‍ය වේ. මනා ජල වහනයක් සහිත විය යුතු අතර , බැක්ටීරියා කොළ පුල්ලි රෝගයට ගොදුරු වූ භූමියක් නොවිය යුතුය. සාමාන්‍යයෙන් මෙම බැක්ටීරීයාවන්ට වියළි පසේ අවුරුද්දක පමණ කාලයේ ජීවත් විය හැකි බැවින් එවැනි භූමියක වගා කිරීම නිසා රෝගයට ගොදුරු වීමේ ප්‍රවණතාවය වැඩි විය හැකිය. පොදු ජල ප්‍රවාහයකට බැක්ටීරියාවන් එකතු විය හැකි බැවින් ආරක්ෂිත ජල ප්‍රවාහයක් භාවිතා කිරීම ඉතාම හිතකර වේ.

ඉහත ආකාරයට තෝරා ගත් වගා බිම තුල දිග අඩි 4 හා පළල අඩි 25 පාත්ති සකසා ගත යුතු ය. පාත්ති 2 ක් අතර අරතරය අඩුම වශයෙන් අඩි 5 විය යුතුය. එම පරතරය වැඩිවත්ම වැඩි වැඩ බිම් ප්‍රමාණයක් අපතේ යන අතර එම පරතරය අඩු වීමත් සමඟ නඩත්තු කටයුතු අපහසු වනවා මෙන්ම රෝග බෝවීම සීඝ්‍රයෙන් පැතිරීමටත් හේතු වේ. එලෙස සැකසූ පාත්ති අඩි 1.5

පමණ ගැඹුරට පස පෙරළා, පොළොව මට්ටමේ සිට අඟල් 4 ක් පමණ ගැඹුරින් යුත් ගිල්ලුණු පාත්තියක් සකස් කළ යුතුය.

මේ ආකාරයෙන් සකස් කර ගත් පාත්ති පිදුරු, දහයියා හා පිදුරු වශයෙන් අනුපිළිවෙළින් තට්ටු තුනක් ලෙස අතුරා පාත්ති මත පුළුස්සා ගැනීමෙන් පාත්ති ජීවාණුහරණය කර ගත හැකිය. එලෙස කිරීමට ප්‍රථම ගිල්ලුණු පාත්තිය හොඳින් ජලය යොදා තෙත් කර ගත යුතු ය. එහිදී ජල වහනය මනාව සිදු කර ගැනීමට ගැඹුරු කාණුවක් කපා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

බුලත් දඬු පැළ කර ගැනීමේදී සකස් කරන ලද පාත්තියේ දඬු එලෙසින්ම සිටුවා ගැනීම හෝ දඬු පොලිතීන් බෑග් වල පැළ කර පසුව පාත්තිවල සිටුවීම යන ක්‍රම දෙකින් සුදුසු ක්‍රමයක් අනුගමනය කළ හැකිය. බුලත් පාත්තිවලට සෙවණ මෙන්ම දිනපතා ජලයද අවශ්‍යය. තද හිරු රශ්මිය තිබේ නම් දිනකට දෙවරක් ජලය යෙදිය යුතුය.

## 6.2 රෝග හා පලිබෝධ හානි

බුලත් වගාව සඳහා පලිබෝධකයින්ගෙන් සැලකිය යුතු හානියක් නොවන අතර , බුලත් වගාවට වැළදෙන බැක්ටීරියා කොළ පුල්ලි රෝගය ඉතාමත් අනර්ථකාරී වේ.“සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස් බෙට්ලිකෝලා” ( Xanthomonas campestris betlicola ) යනුවෙන් හැඳින්වෙන බැක්ටීරියාව මගින් මෙම රෝගය වැළදෙයි. “ රෝගේ ,කොල රෝගේ, තෙල් කුනාව හෙවත් මහ ලෙඩේ ”ලෙස බුලත් වගාකරුවන් හඳුන්වන්නේ මෙම රෝගයයි. මෙහි මූලික ලක්ෂණය වනුයේ පත්‍ර මත තෙත් ගතියක් සහිත පුල්ලි හට ගැනීමයි. ක්‍රම ක්‍රමයෙන් මෙම පුල්ලි විශාල ලප බවට පත්වේ. මෙම රෝගය දරුණු වූ විට බුලත් වැළෙහි කොළ හැලී යන අතර, අවසානයේදී බුලත් වැල මැරී යයි. මෙම බැක්ටීරියා කොළ පුල්ලි රෝගය ජලය ,වාතය හා කෘමි සතුන්ගේ ද , මෙම ක්ෂේත්‍රයේ වැඩ කරන මිනිසුන් භාවිතා කරන මෙවලම් හා උපකරණ මගින් ද රෝගය පැතිර යා හැකිය .

ඊට අමතරව බුලත් වගාව සඳහා පාමුල කුණුවීමේ රෝගය , පත්‍රවල ඇතිවන දිලීර පුල්ලි රෝගය හා වටපණු හානියද ඇති වේ. මීට පෙර සඳහන් කළ ආකාරයට කෘමීන්ගෙන් තදබල හානියක් නැතත්, කලාමැදිරි හානිය දරුණු ලෙස දක්නට ලැබේ. එමෙන්ම රතු මයිටා හානියද බහුල වශයෙන් දක්නට ලැබෙන අතර, දළඹුවන්ගෙන් වන හානිය දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි.

**6.3 වෙළඳපලට සැපයීම සඳහා බුලත් සැකසීම**

දේශීය පරිභෝජනයට මෙන්ම විදේශීය වෙළඳපොල සඳහා බුලත් සැපයීම සිදු කෙරේ . එහිදී විදේශ වෙළඳපොලට සැපයීමේදී එම බුලත්වල තිබිය යුතු ගුණාංග කිහිපයක් පිළිබඳව සලකා බැලේ . එම බුලත් කඩතොළුවලින් තොර , තද කොළ පැහැති වියළී නොගිය අළුත් විශාල නොළ විය යුතුය .එමෙන්ම එහි නටුව කළු පැහැයෙන් තොර විය යුතු අතර බුලත් කොළයේ නටුව 2.5 cm – 3.0 cm පමණ දිගට කපා තිබිය යුතුය.

සාමාන්‍යයෙන් බුලත් වැලෙන් නෙලා ගන්නා බුලත් කොළය නටුවෙන් අඩක් සහිතව නෙලා ගනු ලබයි. එය 2.5 cm – 3.0 cm පමණ වන සේ කපා දමා ජලයෙන් සෝදා බුලත් තට්ටු වලට අසුරා වෙළඳපොලට ප්‍රවාහනය කරනු ලබයි.

බුලත් තට්ටු වලට ඇසිරීමේදී කෙසෙල් පරඬැල්යටට අතුරා රවුම් බට තට්ටු එක උඩ සිටින සේ අතුරා නැවතත් තට්ටු උඩින් කෙසෙල් පරඬැල් අතුරා රවුම් පියනකින් වසා බුලත් කෙළෙ පිටතට නොපැමිණෙන ලෙස ලණු බැමි යොදා බැඳ ගනු ලැබේ. එහිදී බුලත් තට්ටුවෙහි ඇතුළත පවතින අධික උෂ්ණත්වය පාලනය කිරීම සඳහා නැවතත් ජලයෙන් තෙමා ප්‍රවාහනය කරනු ලබයි.

## 7. සම්පත්දායකයන් විසින් ලබා දුන් දායකත්වය

| සම්පත්දායකත්වය | දායකත්වය |
|---|---|
| සංජීව වීරසිරි මයා<br>වත්තේමුල්ල,<br>බාදුරාගොඩ<br>( 0773896424) | ❖ විදේශීය වෙළඳපොල ඉලක්ක කර ගත් ආයතනයකි.<br>❖ ණයවර ලිපි විවෘත කිරීම මගින් මෙම කටයුතු සිදු කරනු ලබයි.<br>❖ මෙම ආයතනයෙන් සෘජුවම බුලත් මිලදීගන්නා විදේශිකයන් පිරිසක් සිටිති. ( Direct Buyers)<br>❖ ප්‍රධාන වශයෙන් කළු බුලත් අපනයනය කරන අතර, අපනයනය කරනු ලබන්නේ පාකිස්ථානයටය.<br>❖ බාබුල් නිෂ්පාදනයට හා විට සඳහා බුලත් මිලදී ගන්නා බව සඳහන් කරයි.<br>❖ ගුවන් සේවා හරහා ප්‍රවාහනය කරන අතර ,1 Kg ක බුලත් තොගයක් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලන්කන් කටාර් ගුවන් සේවාව ( Sri Lankan Quatar ) හරහා රු.2.25ක් ද , ශ්‍රී ලන්කන් එයාර්වේස් ( Sri Lankan Airways ) හරහා |

| | |
|---|---|
| | රු. 2.45 ක් ලෙසද ප්‍රවාහන ගාස්තු වැයවේ.<br>❖ අපනයන තත්වයේ පවතින බුලත් සියළුම ප්‍රදේශවලින් ප්‍රමාණ සීමාවකින් තොරව මෙම ආයතනය මිලදී ගනු ලබයි.<br>❖ සාමාන්‍යයෙන් අපනයනය කරන බුලත් තට්ටුවක් 9Kg ක් පමණ බරකින් යුක්තය.<br>❖ කුලියාපිටියේ සතිපතා බුලත් පොලක් තිබෙන අතර, එයින් තීරණය වන මිල ගණන් අනුව මෙම ආයතනය බුලත් මිල තීරණය කරනු ලබයි. |

| සම්පත්දායකත්වය | දායකත්වය |
| --- | --- |
| ඒ.පී. බන්දුලසේන මයා<br>මහනුවර පොදු වෙළඳ සංකීර්ණය<br>( 071-2654688) | ❖ දේශීය වෙළඳපොල ඉලක්ක කර ගනී<br>❖ සියළුම ප්‍රදේශවලින් රැගෙන එනු ලබන බුලත් මිලදී ගනු ලබයි.<br>❖ දේශීයව පරිභෝජනය වන බුලත් "කඳ කොළ ලොකු", "කඳ කොළ කුඩා","පීදුනු කොළ ලොකු", "පීදුනු කොළ කුඩා", "රැන් කොළ ලොකු","රැන් කොළ කුඩා" වශයෙන් වර්ගකොට වෙළඳපොළට සපයනු ලැබේ.<br>❖ එක් බුලත් තට්ටුවක කොළ 4000-5000 ක ප්‍රමාණයක් අන්තර්ගත වේ.<br>බුලත් තට්ටුව ජලයෙන් තෙමා වෙළඳපොල වෙත ප්‍රවාහනය කරන අතර බුලත් නෙලීම, සකස් කිරීම හා වෙළඳපොලට ප්‍රවාහනය අතර කාල පරාසය අවම මට්ටමක තබා ගැනීම වඩාත් යෝග්‍ය වේ. |

අපනයනය සඳහා බුලත් සැකසීමට පෙර



අපනයනය සඳහා බුලත් සකසා ඇති ආකාරය



## 8.හඳුනාගත් ගැටළු හා ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා

1. අනෙකුත් බෝග වගාවන් හා සසඳන විට බුලත් වගාව නිශ්චිත වගාවක් නොවේ. බැක්ටීරියා කොළ පුල්ලි රෝගය වැළඳීම එයට හේතුවයි.
   - ❖ රෝග මර්දනය සඳහා සාර්ථක ක්‍රමයක් මෙතෙක් සොයා ගෙන නොමැති අතර ඒකාබද්ධ රෝග මර්දන ක්‍රමය මගින් පාලනය කිරීම යෝග්‍ය වේ. එමෙන්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික තොරතුරු අංශය හා අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය හා එක්ව පර්යේෂණ මට්ටමින් අධ්‍යයනය කර පලිබෝධ නාශකයක් හඳුන්වා දීම.
2. බුලත් අස්වැන්නේ හිඟතාවය .
   - ❖ ඉහළ ආදායම් මාර්ගයක් වන බැවින් තරුණ ප්‍රජාව මේ සම්බන්ධයෙන් දැනුවක් කිරීම හා ස්වයංරැකියාවක් ලෙස හඳුන්වා දීම.

3. බුලත් වෙළඳපොලෙහි පවතින ඒකාධිකාරය .

- ❖ අපනයනකරුවන් හා අතරමැදිකරුවන්ගෙන් සමන්විත ඒකාධිකාරයක් පැවතීම නිසා සාධා රණ මිලක් වගාකරුවනට නොලැබී යයි. ඒවැනි තත්වයක් යටතේ රජය මැදිහත් වී ඒ සම්බන්ධ වැඩපිළිවෙලක් සකස් කිරීම .

4. බුලත් වගාවට අවශ්‍ය ආධාරක ඉනි ලබා ගැනීමේ අපහසුතාවය .

- ❖ විකල්ප වගා ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ඊට අවශ්‍ය උපදෙස් ලබා දීම හා ඒවා යාවත්කාලීන කිරීම .

5. බුලත් භාවිතයෙන් විවිධ අගය එකතු කළ නිෂ්පාදන බිහි කිරීමට හැකියාවක් පවතින බව බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය ඒකාබද්ධව ගෙන ගිය පර්යේෂණ මගින් තහවුරු කර ඇත. මෙම නිෂ්පාදන අතර දත් බෙහෙත්, මුඛ සෝදන දියර, වියළන ලද බුලත් කුඩු /පෙති ලෙස සැකසීම, කෘමි හා මදුරු විකර්ශකයක් ලෙස භාවිතා කිරීම, සුරතල් සතුන්ගේ පළිබෝධකයන් මර්දනයට යොදා ගැනීම, ආහාර කල් තබා ගැනීමට යොදා ගැනීම හා ප්‍රතිඔක්සිකාරකයක් ලෙස යොදා

ගැනීම ප්‍රධාන  තැනක් ගනී.එවන් පසුබිමක් තුළ අගය එකතු කළ නිෂ්පාදන බිහි කිරීමට අවස්ථා සලසා දීම.

## 9. දෙපාර්තමේන්තු අපේක්ෂාව

ශ්‍රම වෙළඳපොල ව්‍යවසායක අවස්ථා බහුල කොට, සේවා නියුක්තිය හා ආදායම් උත්පාදන හැකියාවන් වර්ධනය කිරීමට සුදුසු ආයෝජන අවස්ථා ව්‍යවසායකයින් වෙත හඳුන්වා දීම ඉලක්ක කර ගත් පර්යේෂණ වැඩසටහනක එක් ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව ඔබ වෙත ඉදිරිපත්කෙරෙන අතර, ඔබෙත්,රටේත් උන්නතිය සඳහා මෙවැනි අවස්ථා භාවිතා කරනු ඇතැයි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.